RARE

# ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන්ගේ සන්නිවේදන කුසලතා හා රැකියා අවස්ථා කෙරෙහි එහි ඇති සම්බන්ධතාව


| | |
|---|---|
| ප්‍රවේශ අංකය: | 1171 |
| වර්ග අංකය: | |

කැලණිය විශ්වවිද්‍යාලයේ ජන සන්නිවේදනය පිළිබඳ දර්ශන විශාරද උපාධිය සඳහා

ඉදිරිපත් කරන ලදි.

2014 මැයි.

## සාර සංග්‍රහය

වර්තමාන ලාංකීය රැකියා වෙළඳපොල සඳහා අවශ්‍ය සන්නිවේදන කුසලතා කවරාකාර වේද? සහ ශ්‍රී ලංකාවේ ජාතික විශ්වවිද්‍යාල තුළින් බිහිවන උපාධිධාරීන්ගේ සන්නිවේදන කුසලතා කවරාකාර වේද? යන ගැටළු මුල් කර ගත් මෙම අධ්‍යයනයේ පර්යේෂණ ක්‍රමවේදයට අනුව වර්තමාන රැකියා වෙළඳපල තුළ සේවායෝජකයින් රැකියා අපේක්ෂිත උපාධිධාරියෙකුගෙන් බලාපොරොත්තු වන සන්නිවේදන කුසලතා මට්ටම හඳුනා ගැනීම සඳහා, පුවත්පත් හා අන්තර්ජාලයේ පලකරන ලද රැකියා ඇබෑර්තු දැන්වීම් පාදක කොට ගෙන අදාළ ආයතන වල ප්‍රධානීන් හෝ බඳවා ගැනීම් සම්බන්ධ නිළධාරීන් සමග සම්මුඛ සාකච්ජා මෙන්ම දුරකථන සාකච්ජා ඔස්සේ ප්‍රශ්නාවලි භාවිත කර ප්‍රාථමික දත්ත රැස් කිරීම සිදු කෙරිණ. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල වලින් උපාධි අපේක්ෂා කරන විද්‍යාර්ථීන්ගේ සන්නිවේදන කුසලතා මට්ටම හඳුනා ගැනීම සඳහා අවශ්‍ය දත්ත රැස් කිරීමේ දී ඉලක්ක කණ්ඩායම් හා තනි පුද්ගල වශයෙන් සම්මුඛ සාකච්ජා, ප්‍රශ්නාවලි, නිරීක්‍ෂණ, භාවිතයට ගෙන දත්ත රැස් කරන ලද අතර, එම නියැදින්ට අදාලව ප්‍රමාණාත්මක හා ගුණාත්මක වශයෙන් ලබා ගත් දත්ත 'SPSS' මෘදුකාංගයේ 17 පැකේජය භාවිත කරමින් ඒ ඒ නෛසර්ගිකයන් ඔස්සේ වෙන් වෙන් වශයෙන් වර්ගීකරණය කොට විශ්ලේෂණය කරනු ලදි. එහිදී ප්‍රශ්නාවලියේ ප්‍රශ්න වලට අනුව දත්ත වගු ගත කරමින් විශ්ලේෂණය සිදුකළ අතර ප්‍රස්ථාර භාවිතය මගින් වැඩි දුරටත් පැහැදිලි කරමින් එම සාධක පෙන්නුම් කර ඇත.

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල වලින් උපාධි අපේක්ෂා කරන විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන්ගේ සන්නිවේදන කුසලතා මට්ටම හා වර්තමාන රැකියා වෙළඳපල තුළ සේවායෝජකයින් රැකියා අපේක්ෂිත උපාධිධාරියෙකුගෙන් බලාපොරොත්තු වන සන්නිවේදන කුසලතා මට්ටම අතර පරතරය හඳුනා ගැනීමෙන් පසුව ඒ සඳහා විකල්ප යෝජනා ලබා ගැනීම සඳහා විශ්වවිද්‍යාල හා රැකියා ක්ෂේත්‍ර වල විවිධ විද්වතුන් කිහිප දෙනෙකු සමග සමග සාකච්ජා පැවැත්වූ අතර දැනට විශ්වවිද්‍යාල තුළ හඳුන්වා දී ඇති සන්නිවේදන කුසලතා අන්තර්ගත වන විෂය ඒකක ද නිරීක්ෂණය කරන ලදි. එම සම්මුඛ සාකච්ජා සහ නිරීක්ෂණ මගින් ලබා ගත් තොරතුරු ද සුදුසු ලෙස මෙහි ඇතුළත් කොට ඇත.

පර්යේෂණයේ නිගමන මෙසේ දැක්විය හැකියි.

- 2013 වර්ෂයේ පුවත්පත් වල හා අන්තර්ජාලයේ පල කර තිබූ කළමනාකරණ උපාධිධාරීන්ට අයදුම් කළ හැකි රැකියා පුරප්පාඩු දැන්වීම් වලට අදාල ආයතන වල සේවායෝජකයන් සියළු දෙනාම එම පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට අපේක්ෂා කරන අපේක්ෂකයන්ගෙන් අනිවාර්ය සුදුසුකමක් ලෙස 'සන්නිවේදන කුසලතා' බලාපොරොත්තු වේ.
- එම කුසලතාව උපාධි අපේක්ෂකයෙකුට විශ්වවිද්‍යාලයෙන් ලබා දිය යුතු බව බහුතරයගේ අදහස වන අතර උපාධිධාරියෙකුට රැකියාවට ප්‍රවේශවීමේදී කුසලතා වර්ධනය සඳහා අමතර පුහුණුවක් ද අවශ්‍ය බව නියැදියේ සේවායෝජකයන්ගෙන් අඩකට ආසන්න පිරිසකගේ අදහස වේ.



**උදාත්ත වචන :** සන්නිවේදනය : උපාධිධාරීන් : විද්‍යාර්ථීන් : සන්නිවේදන කුසලතා : සේවා නියුක්තිකයා